ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2026/38 – 2017 ජූලි 07 වැනි සිකුරාදා – 2017.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2017 අංක 137 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/11/2016/යූඩීඒ/452.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: කඩු/අත්./154/යූඩීඒ.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2017 ජූලි මස 05 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.**– ප්‍රාදේශීය ලේකම්, කඩුවෙල.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලංගම උතුර (කඩුවෙල මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/ඩීඑස්ඕ/2016/876 හා 2017.01.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'බී' – කොස්වත්ත සමූපකාර පිරවුම්හල – ප්‍රමාණය: හෙක්. 0.0279**

උතුරට: කොස්වත්ත තලංගම පාරේ වරි. අංක නොදන්නා ඉඩම සහ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: කැබලි අක්ෂර ඒ සහ කොස්වත්ත හන්දිය; දකුණට: කොස්වත්ත හන්දිය සහ පුද්ගලික පාර; බටහිරට: පුද්ගලික පාර සහ කොස්වත්ත තලංගම පාරේ වරි. අංක නොදන්නා ඉඩම.

07 - 733


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*